# කොවිඩ් - 19 සති පාසල - සබරගමුව පළාත
# ශ්‍රේණිය භූගෝල විද්‍යාව
# ඒකකයේ 2 ශ්‍රී ලංකාවේ භූ දර්ශන

**පැවරුම් අංක 6**

ක්‍රියාකාරකම 6 - ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය සහ ජනාවාස පිළිබඳ හඳුනා ගනිමු.

හැඳින්වීම - රටක දළ උපත් අනුපාතිකය හා දළ මරණ අනුපාතිකය අතර වෙනස ජන සංඛ්‍යාවේ ස්වභාවික වර්ධනය ලෙස සැලකේ. එයට ශුද්ධ සංක්‍රමණ එකතු කළ විට සමස්ත ජන සංඛ්‍යාවේ වර්ධනය නිරූපණය වේ. ජන සංඛ්‍යාව පිළිබඳ හැදෑරීමේදී ජනාවාස ද වැදගත් වේ. ජීවත්වීම සඳහා ජනයා ඒක රාශී වීමෙන් ජනාවාස නිර්මාණය වේ. ජන සංඛ්‍යාවේ වර්ධනය හා ජනාවාස පිළිබඳ හැදෑරීම මෙම සතියේ ක්‍රියාකාරකම් මගින් ආවරණය කෙරේ.

ගුණාත්මක යෙදවුම් - 9 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොත,සටහන් පොත,පෑන්, පැන්සල්

ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස්

පියවර 1 - භූගෝල විද්‍යාව පෙළ පොතේ පිටු අංක 53 සිට 55 තෙක් හොඳින් කියවන්න.

පියවර 2 - පෙර ක්‍රියාකාරකම් පරිදිම සටහන් පොතේ පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. ඒ සඳහා පිටු අංක 53 සිට 55 තෙක් උපකාර කර ගන්න.

**ප්‍රශ්ණාවලිය**

01. ජන සංඛ්‍යා වර්ධනය ලෙස සැලකෙන්නේ කුමක්ද?
02. පෙළ පොතේ 2.3 ප්‍රස්ථාරයට අනුව 1871 සිට 2012 කාල පරිච්ඡේදය තුළ ජන සංඛ්‍යාවේ හඳුනාගත හැකි ප්‍රවණතාව කුමක්ද?
03. ජනාවාසයක් යන්න කෙටියෙන් හඳුන්වන්න
04. ප්‍රධාන ජනාවාස වර්ග 3 කවරේ ද?
05. “වැව් ගම්මාන” අයත් ජනාවාස වර්ගය කුමක්ද?

**පසු වැඩ ක්‍රියාකාරකම්**

ප්‍රධාන ජනාවාස වර්ග 3ට අදාළ ව එක් එක් ජනාවාස වර්ගයේ ලක්ෂණ හා එම ජනාවාස වලට නිදසුන් ඇසුරු කර ගනිමින් කර ගනිමින් “ ශ්‍රී ලංකාවේ ජනාවාස” මැයෙන් ලිපියක් සකස් කරන්න.

මෙම පසු වැඩ ක්‍රියාකාරකම් සඳහා පිටු අංක 54 සිට 55 උපයෝගී කරගන්න. අමතර කියවීම්ද ඇසුරු කර ගන්න. පාසල ආරම්භ වූ පසු මෙම ක්‍රියාකාරකම් ඔබගේ විෂය භාර ගුරුභවතා වෙත ලබා දීමට කටයුතු කරන්න.

සැකසුම -

එම්.බී.නදීරා දිල්හානි මිය - ර/නිවි/ කෙහෙල්ඕවිගම විද්‍යාලය